පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

# අවසාන වාර පරීක්ෂණය - 2022

## 09 - ශ්‍රේණිය
## බුද්ධ ධර්මය - පිළිතුරු පත්‍රය

### I කොටස

| | | | | | |
|---|---|---|---|---|---|
| 01 | - | 02 | 11 | - | 02 |
| 02 | - | 03 | 12 | - | 03 |
| 03 | - | 04 | 13 | - | 02 |
| 04 | - | 02 | 14 | - | 04 |
| 05 | - | 04 | 15 | - | 03 |
| 06 | - | 01 | 16 | - | 02 |
| 07 | - | 01 | 17 | - | 01 |
| 08 | - | 02 | 18 | - | 01 |
| 09 | - | 04 | 19 | - | 02 |
| 10 | - | 03 | 20 | - | 03 |

### II කොටස

01. i. බුදු, පසේ බුදු, මහ රහත්, සක්විති රජ. (මේ අතරින් දෙකකට ලකුණු දෙන්න)

ii. හන්දදානි භික්ඛවේ - ආමන්තාමී වෝ
වයධම්මා සංඛාරා - අප්පමාදේන සම්පාදේථ

"මහණෙනි, කරුණාවෙන් ඔබ අමතමි. සියළු සංස්කාර ධර්ම නැසෙන සුළු ය. එබැවින් නොපමාව දුකින් මිදීම පිණිස කුසල ධර්ම සම්පූර්ණ කරන්න." (පෙළ පොත - 07 පිටුව )

iii. සුපටිපන්න, උජුපටිපන්න, ඤායපටිපන්න, සාමීචිපටිපන්න, ආහුනෙය්‍ය, පාහුනෙය්‍ය, දක්ඛිණෙය්‍ය, අඤ්ජලිකකරණීය, අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලෝකස්ස

iv. පිරිමි දරුවන් - බද්ධ පරියංකය (එරමිණිය ගොතා)
ගැහැනු දරුවන් - අර්ධ පර්යංකය (පාද පසුපසට නවා)

v. යථාවාදී තථාකාරී - යථාකාරී තථාවාදී බව

vi. ගොවිතැන, ධාර්මික වෙළඳාම, රාජ්‍ය සේවය, ගුරු සේවය, නීතිඥ වෘත්තිය, හස්ත කර්මාන්ත.........
(පෙළ පොත - 141 පිටුව බලන්න)

vii. ගිහි - පැවිදි සබඳතාව (උඩ දිසාව)
සේව්‍ය - සේවක සබඳතාව (යට දිශාව)

viii. සිව් බඹ විහරණ, චතු අප්පමඤ්ඤා

ix. ශ්‍රී බුද්ධ රශ්මි

x. ලද දෙයින් සතුටු වෙයි. (සන්තුස්සකො)
පෝෂණය කිරීම පහසු ය. (සුභරෝ)
විවේකීව වාසය කරයි. (අප්පකිච්චෝ)
පැවැත්ම සැහැල්ලු ය. (පල්ලවුකවුත්තී)
ඉන්ද්‍රිය සංවර ය. (සන්තින්ද්‍රියෝ)
නුවණැති ය. (නිපකො)
(පෙළ පොත - 86 පිටුව බලන්න)

02. i. රුවන්වැලි මහා සෑය
ශ්‍රී මහා බෝධිය
ථූපාරාමය
අභයගිරිය
ජේතවනය / ජේතවනාරාමය
ලංකාරාමය
ලෝවාමහාපාය
මිරිසවැටිය (මින් දෙකක් සඳහා ලකුණු ලබා දෙන්න)

ii. පූජනීය ස්ථානවල නම් ගම් සටහන් නොකිරීම.
අනවශ්‍ය ලෙස ශබ්ද නැගීම (කෑ ගැසීම) නොකිරීම.
නුසුදුසු ආහාර පාන භාවිතයෙන් වැළකීම.
නොගැලපෙන වදන් භාවිතයෙන් වැළකීම.
නුසුදුසු ගීත ගායනයෙන් හා වාදනයෙන් වැළකීම.
අදාළ ස්ථානයේ පෞරාණිකත්වයට හා ගෞරවයට හානි වන කිසිවක් නොකිරීම.
(මින් තුනකට ලකුණු දෙන්න)

iii. ගමේ පන්සලේ දී තෙරුවන් පුදා භාර වීම
වන්දනා කාලය තුළ නිර්මාංශව සිටීම
සංවර ඇඳුමින් සැරසීම
වන්දනා කවි පමණක් ගායනා කිරීම
පූජා ද්‍රව්‍ය රැගෙන යාම (පෙළ පොත 25 පිටුවේ ඇතුළත් කරුණු වලට අදාළ පිළිතුරකට ලකුණු ලබා දෙන්න)

03. i. අත්තනාව කතං පාපං - අත්තනා සංකිලිස්සති
අත්තනා අකතං පාපං - අත්තනාව විසුජ්ඣති
සුද්ධි අසුද්ධි පච්චත්තං - නාඤ්ඤෝ අඤ්ඤං විසෝධයේ

ii. තමා විසින් ම කරවන ලද පාපය තමා කිලිටි කරන්නේ ය. තමා විසින් නොකරන ලද පාපය තමා පිරිසිදු කරයි. පිරිසිදු බව හෝ අපිරිසිදු බව තම තමා අත ම පවතින්නකි. කෙනෙක් තව කෙනෙකු පිරිසිදු නොකරයි.

iii. යහපත් පුද්ගලයෙක් බිහි වීම සඳහා සාධු චර්යාවල යෙදීම කළ යුතු වේ. පස් පවින් වැළකීම, දස අකුසලයෙන් වෙන් වීම, පරාභව කරුණු වලින් බැහැර වීම...... වැනි කරුණු මූලික කර ගනිමින්, විවිධ කටුක තත්වයන් විඳ දරා ගනිමින් තමා යහපත්ව ජීවත් වන්නේ නම් එම තත්ත්වය උදා කර ගත හැකි වේ. ඒ සඳහා අප කළ යුතු වන්නේ පව්කම්වල විපාක හඳුනාගෙන ඒවායින් ඈත්ව ඇපකැපවී කටයුතු කිරීමයි. එවිට ජීවිතය උසස් මට්ටමට පත් කර ගැනීමට හැකි වනු ඇත.
(පෙළ පොත 07 පිටුව ඇසුරෙන් ලියා ඇති පිළිතුරකට ලකුණු ලබා දෙන්න)

04. i. ලාභ ප්‍රයෝජන අපේක්ෂාවෙන් මිථ්‍යා ලබ්ධික පිරිස් සසුන් ගත වීම නිසා ඇති වූ ගැටලු.

ii. පැලලුප් නුවර අශෝකාරාමය, ධර්මාශෝක රජතුමා, මොග්ගලී පුත්ත තිස්ස මහ රහතන් වහන්සේ.

iii. ශාසනයේ ඉදිරි පැවැත්ම හා ව්‍යාප්තියට තෙවන ධර්ම සංගායනාවෙන් වූ මෙහෙය අලලා පිළිතුර ගොනු කර ඇත්නම් ලකුණු දෙන්න.
(පෙළ පොත 126/ 127 පිටු ඇසුරෙන් ලියා ඇති පිළිතුරකට)

05. i. මහණෙනි, මම චේතනාව කර්මය යැයි කියමි. සිතින් සිතා කයින්, වචනයෙන් හා මනසින් කර්ම රැස් කරයි.

ii. පර පණ නැසීම, සොරකම් කිරීම, වැරදි කාම සේවනය, බොරු කීම, කේලාම් කීම, පරුෂ වචන කීම, හිස් වචන කීම, දැඩි ලෝභය, දැඩි තරහව, වැරදි දැකීම. (මින් තුනක්)

iii. පුද්ගලයා සිදු කරන කර්මවල විපාක සසර පුරාවටම ලැබේ. කිසියම් භවයක උපත ලැබීම සඳහා අතීත කර්ම ද ඉවහල් වේ. තිරිසන්, ප්‍රේත, අසුර ලෝකවල උපත ලබා දුක් විඳීමට සිදුවන්නේත් දිව්‍ය, මනුෂ්‍ය, බ්‍රහ්ම ආදී ලෝකවල උපත ලබා සැප විඳීමට හේතුවන්නේත් අප විසින් සිදු කරනු ලබන කුසලාකුසල කර්මවල බලපෑම නිසාය. එම නිසා අකුසලයෙන් වැළකී අලෝභ, අද්වේශ, අමෝහ යන කුසල මූලයන් පෙරටු කොටගෙන යහපත් ක්‍රියා සිදු කිරීම මඟින් මෙලොව හා පරලොව යහපත් දිවියක් ගත කිරීමට හැකි වන්නේ ය. (සුදුසු පිළිතුරකට ලකුණු දෙන්න.)

06. i. දානය, ශීලය, පරිත්‍යාගය, ඍජු බව, මෘදු බව, තපස, අක්‍රෝධය/ මෛත්‍රිය, අවිහිංසාව, ඉවසීම, විරුද්ධ නොවීම (මින් දෙකක් )

ii. රට වැසියාගේ ආර්ථික සමෘද්ධිය උදාකරලිමේ අරමුණින් රජු විසින් ජනතාවට සම්පත් බෙදා දීම දානයයි.

උදා :- කෘෂි කර්මාන්තයට බීජ, උපකරණ, පොහොර ආදිය ලබා දීම.
වෙළඳාමේ දී මූලික ධනය. ණය පහසුකම් ලබා දීම.
රාජ්‍ය සේවකයන්ට වැටුප් හා ආහාරපාන ලබා දීම.

පාලකයා තම කාලය, කායික හා මානසික ශ්‍රමය, ධනය, සුවපහසුව රටේත් ජනතාවගේත් යහපත සඳහා කැප කිරීම පරිත්‍යාගයයි. ඉන් මුළු රාජ්‍යයේම යහපත උදා වේ. එම නිසා දානයට වඩා පුළුල් අර්ථයක් පරිත්‍යාගයෙන් කියැවේ.

iii. රටක පාලකයකු දස රාජ ධර්ම සුරකී නම් එම රට නිසැකවම සංවර්ධිත රටක් බවට පත්වේ. රට තුළ සාමකාමී පරිසරයක් ගොඩනැගේ. බොහෝ ගැටලු අවම වේ.
(පෙළ පොත 23 පාඩම ඇසුරෙන් ලියා ඇති පිළිතුරකට ලකුණු ලබා දෙන්න)

07. i. කාමේසු මිච්ඡාචාරා වේරමණී සික්ඛා පදංසමාදියාමි.
සුරාමේරය මජ්ජපමා දට්ඨානා වේරමණී සික්ඛා පදං සමාදියාමි.

ii. ශරීරයේ යහපැවැත්ම. යැපීම
උපන් කුසගිනි වේදනා දුරුකර ගැනීම.
නූපන් කුසගිනි වේදනා වැළැක්වීම.
ආයුෂ, වර්ණය, සැපය, බලය, නුවණ වැඩි දියුණු වීම.

iii. පුද්ගලයෙකුගේ යහපැවැත්මට කායික නිරෝගීතාව අත්‍යවශ්‍ය කරුණකි. ඒ වෙනුවෙන් නිවැරදි සෞඛ්‍ය පිළිවෙත් අනුගමනය කිරීම වැදගත් වේ. කුසගිනි නිවා ගැනිමට ලබා ගන්නා ආහාරය ද ඉන් ප්‍රධාන තැනක් ගනී. සුදුසු ආහාරපාන, සුදුසු වෙලාවට, සුදුසු ප්‍රමාණයට, මනා සිහිබුද්ධියෙන් ගත යුතු බව බෞද්ධ මතයයි. එවිට උපන් කායික වේදනාවන් දුරුවෙයි .ගත් ආහාර සැනෙකින් දිරවන නිසා ආයුෂ සම්පත් දියුණු වෙයි. කය නීරෝගී වෙයි. අධි පෝෂණය හෝ මන්ද පෝෂණ තත්වයන් ඇති නොවෙයි.
(පෙළ පොත 117 පිටුව කරුණු ඇසුරෙන් ලියා ඇති පිළිතුරකට ලකුණු ලබා දෙන්න)